00083

ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව
නීතිවේදී උපාධි පාඨමාලාව - 2023/2024
**4 වන මට්ටම**
**LLU 4708 - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය II**
අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය II
කාලය පැය (01) එකයි

---

දිනය - 2025 ජනවාරි 11 වේලාව - පෙ.ව. 11.30 – ප.ව.12.30

---

අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.
ප්‍රශ්න ගණන 02 යි.
**එක් (01) ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.**

1. වෘත්තීය සමිති නායකයකු වන අමල්, 2024 දෙසැම්බර් 07 වන දින ගෝල්ෆේස් ග්‍රීන් පාක් පරිශ්‍රයේ දී සාමකාමී උද්ඝෝෂණයක නිරත වෙමින් සිටියදී පොලිසිය විසින් අත්අඩංගුවට ගනු ලැබීය. අමල්, පොලිසිය වෙතින් තමන් අත්අඩංගුවට ගැනීමට හේතු විමසීමේ දී කිසිදු හේතුවක් දැක්වීම ඔවුන් ප්‍රතික්ෂේප කළහ. පොලිස් නිලධාරීන් අමල්ට බැන වදිමින් බලහත්කාරයෙන් ඔහුව ඔවුන්ගේ වාහනය වෙත ඇදගෙන ගියේය.පොලිස් ස්ථානයට යන අතරතුරදී පොලිස් නිලධාරීන් විසින් අමල්ට පහර දුන් අතර ඔහුට කම්මුල් පහරක් ද එල්ල කළේය. පොලිස් ස්ථානයට ගෙනයාමෙන් පසුව ඔහුව සිරගත කළේය. ඔහු පොලිස් අත්අඩංගුවේ සිටින අතරතුරදී දිගින් දිගටම පොලිස් නිලධාරීන් විසින් ඔහුව ප්‍රශ්න කරනු ලැබීය. ඔහුව ප්‍රශ්න කිරීමේදී ඔහු කායික හිංසනයන්ට ලක් විය: බැටන් පොලු වලින් පහර දී, දැඩි විදුලි ආලෝකය දල්වන ලද කාමරයක තැබීම සහ නින්දට බාධා කිරීම සිදුවිය.අමල් වතුර ස්වල්පයක් ඉල්ලූ අවස්ථාවේ පොලිසිය විසින් එය ප්‍රතික්ෂේප කළේය. පසු දිනයේ දී, කිසිදු චෝදනාවකින් තොරව ඔහුව නිදහස් කර තිබිණි. මෙම තත්ත්වයන් යටතේ, අමල්, මූලික අයිතිවාසිකම් පෙත්සමක් පොලිසියට විරුද්ධව ගොනු කිරීමට බලාපොරොත්තු වෙයි.
   ඔහුට උපදෙස් දෙන්න.
   ඔබේ පිළිතුරට අදාළ ආණ්ඩුකම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන සහ අනෙකුත් වෙනත් නෛතික අධිකාරීන් අදාළ කර ගන්න. **(ලකුණු 20)**

2. ..."ඇත්ත වශයෙන්ම, (එවැනි) ආයතනයක හෝ පුද්ගලයාගේ 'විධායක' ස්වභාවය සහ 'විධායක' පාලන මට්ටම් ගැන සඳහන් කිරීම සීමාසහිත අවස්ථාවලදී යුක්ති සහගත සහ අවශ්‍ය විය හැකි නමුත්, අවසානාත්මක වශයෙන්, තීරණය පදනම් විය යුතු වන්නේ, ක්‍රියාව "විධායක හෝ පරිපාලනමය" ස්වභාවයේ ද යන්න මත මිස ආයතනය හෝ නිළයේ තත්ත්වය මත නොවේ."
   **Fernando J, in *Parameswary Jayathewan* v. *Attorney General and Others* [1992] 2 Sri L.R. 371**
   ඉහත ප්‍රකාශය අනුසාරයෙන් ශ්‍රී ලංකාවේ මූලික අයිතිවාසිකම් යටතේ පරිපාලනමය සහ විධායක ක්‍රියාවන්ගේ අර්ථයට අදාල වසසරිය අධිකරණය අර්ථ නිරූපණය කර ඇත්තේ කෙසේ ද යන්න තක්සේරු කරන්න.
   ඔබේ පිළිතුර අදාල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිපාදන සහ අනෙකුත් නෛතික අධිකාරීන් භාවිතා කරමින් තහවුරු කරන්න. **(ලකුණු 20)**

***හිමිකම් ඇවිරිණි***